**INVITATION FOR BIDS (IFB)**
**UNIVERSITY OF SRI JAYEWARDENEPURA**

# Supplying, Delivering , Installation, Commissioning and Training of Laboratory Equipments

## IFB No: 04/2019/NCPCAR/FMS

1. The Chairman Department Procurement Committee (DPC) Major on behalf of the University of Sri Jayewardenepura invites sealed bids from eligible and qualified bidders for Supplying, Delivering, Installation, Commissioning and Training **of Laboratory equipments** for the Faculty of Medical Sciences

| Item No | Description | Qty | Bid Security (Rs) |
|---|---|---|---|
| 01 | Cell Sorter | 1 | **500,000.00** |
| 02 | Pahdia Immunocap | 1 | **200,000.00** |
| 03 | Phadia ISAC platform | 1 | **200,000.00** |

2. Bidders who have at least five years experience in Supplying, Delivering, Installation, Commissioning and Training of above Laboratory equipments in similar quantities to State Institutes may submit bids.

3. Bidding will be conducted through National Competitive Bidding (NCB).

4. All bids must be accompanied by bid security in the form of a bank guarantee in the format given with the bidding document in the amount of given in the above table. Bank Guarantee is confirmed by a bank operating in Sri Lanka approved by Central Bank of Sri Lanka. The bid security shall be in the form of an unconditional on demand bond & shall be valid up to **21/08/2019**

5. Interested eligible bidders may obtain further information from Senior Assistant Bursar, Faculty of Medical Sciences, University of Sri Jayewardenepura and inspect the Bidding Documents, free of charge, at the Finance Division, Faculty of Medical Sciences, University of Sri Jayewardenepura (Tel. No 011-2758000, Ex:4040) during office hours.

6. A complete set of Bidding Documents in English language may be purchased by the interested bidders on submission of a written request to the Senior Assistant Bursar, Faculty of Medical Sciences, University of Sri Jayewardenepura and upon payment of a non - refundable fee of **Rs:12,500.00** to the shroff of the University on working days from **10/04/2019 to 06/05/2019** from 9.00 a.m. to 2.30 p.m. The bidding documents are only viewed from the University Website i.e. www.sjp.ac.lk.

7. Duly perfected bids in duplicate in separate covers marked “Original” and “Duplicate” re-inserted in a single cover mentioning the name of work on the top left hand corner of all three envelops, sealed and may either be sent by registered post addressed to “Chairman, Department Procurement Committee, Faculty of Medical Sciences, University of Sri Jayewardenepura, Gangodawila, Nugegoda” or deposited in the Tender Box kept in Finance division, Faculty of Medical Sciences. All Bids should be marked as **“Supplying, Delivering, Installation, Commissioning and Training of laboratory equipments (IFB No: 04/2019/NCPCAR/FMS”** on the top left hand corner of the envelope.

8. Duplicate should be a certified photocopy of the original.

9. Bids will be opened at **1.30 p.m.** on **08/05/2019** at the Board Room of the Faculty of Medical Sciences and the bidder or his/ her representative is permitted to be present at the time of opening of bids.

10. Incomplete and late bids will be rejected and the procurement committee reserves the right to accept or reject bids.

**Chairman,**
**Department Procurement Committee (Major),**
**University of Sri Jayewardenepura,**
**Gangodawila, Nugegoda.**

**ලංසු ආරාධනයයි.**

**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය - වෛද්‍යවිද්‍යා පීඨය**

**ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පීඨය සඳහා රසායනාගාර උපකරණ සැපයීම, ප්‍රවාහනය කිරීම, සවි කිරීම, පුහුණු කිරීම හා ක්‍රියාත්මක කර පෙන්වීම.**

**Supply, Delivering, Installation, Commissioning and Training of Laboratory equipments**
**IFB No: 04/2019/NCPCAR/FMS**

1. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු **(ප්‍රධාන)** සභාපති විසින් වෛද්‍ය විද්‍යා පීඨය සඳහා රසායනාගාර උපකරන සැපයීම, ප්‍රවාහනය කිරීම , සවි කිරීම, පුහුණු කිරීම හා ක්‍රියාත්මක කර පෙන්වීම සඳහා සුදුසුකම් ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

| අයිතමය | විස්තරය | ප්‍රමාණය | ලංසු ඇපකරය (රු.) |
|---|---|---|---|
| 01 | Cell Sorter | 1 | **500,000.00** |
| 02 | Pahdia Immunocap | 1 | **200,000.00** |
| 03 | Phadia ISAC platform | 1 | **200,000.00** |

2. මෙම ලංසුකරුවන් පසුගිය වසර පහක කාලය තුල දී ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආයතන වෙත ඉහත රසායනාගාර උපකරන සැපයීම, ප්‍රවාහනය කිරීම , සවි කිරීම, පුහුණු කිරීම හා ක්‍රියාත්මක කර පෙන්වීම සඳහා පළපුරුද්දක් තිබිය යුතුය.

3. මෙම ලංසු කැඳවීම ජාතික තරඟකාරී ලංසු කැඳවීමේ ක්‍රියාපටිපාටිය යටතේ සිදුකරනු ලැබේ.

4. සියලුම ලංසු ඇපකර **2019/08/21** වන දින දක්වා වලංගු වන ආකාරයේ ඉහත සඳහන් පරිදි වටිනාකම් වලින් යුක්ත වන පරිදි ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කල ශ්‍රී ලංකාවේ වාණිජ බැංකුවක් විසින් නිකුත් කරන ලද කොන්දේසි රහිත වහාම මුදල් ලබා ගතහැකි ලංසු ඇපකරයක් ආකෘතියේ පරිදි අමුණා එවිය යුතුය.

5. මේ සඳහා උනන්දුවක් දක්වන යෝග්‍යතා පූර්ණ ලංසුකරුවනට වැඩ කරන දිනවල කාර්යාලීය වේලාවන් තුළදී ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පීඨයේ ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී වෙතින් වැඩිදුර විස්තර ලබාගැනීම හා ලංසු කැඳවුම්පත් නොමිලේ පරීක්ෂා කිරීම කළහැක. (දු.ක. 011-2758000 Ex: 4040)

6. ඉංග්‍රීසි භාෂාවෙන් මුද්‍රණය කරන ලද සම්පූර්ණ ලංසු කැඳවුම්පත් කට්ටලයක් විශ්වවිද්‍යාලයේ සරප් වෙත **2019/04/10 දින සිට 2019/05/06** දින දක්වා වන සතියේ දින වල **පෙ.ව. 09.00 සිට ප.ව.02.30** දක්වා කාලය තුල දී **ආපසු නොගෙවනු ලබන රු. 12,500.00 මුදලක් ගෙවීමෙන් මිල දී ගත හැක.** එමෙන්ම මෙම ලංසු කැඳවුම් පත් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ නිල වෙබ් පිටුවෙන් **නිරික්ෂණය** කිරීම පමණක් සිදුකල හැක. (www.sjp.ac.lk)

7. නිසිපරිදි සම්පූර්ණ කරන ලද ලංසු පිටපත් දෙකකින් යුතුව අදාල ප්‍රසම්පාදන කමිටුව වෙත **2019/05/08** වන දින **ප.ව. 1.30** ට හෝ ඉන් පෙර ලැබෙන සේ ඉදිරිපත් කළ යුතු අතර, ලංසු පත් ''මුල්පිටපත'' හා ''අනුපිටපත'' යනුවෙන් සඳහන් කර වෙන් වෙන්ව කවර දෙකක බහා එම කවර දෙක එක් ලිපි කවරයක බහා ලිපි කවර තුනෙහිම ඉහළ වම් කෙලවරේ අදාල අයිතමයේ නම සඳහන් කර මුද්‍රා තබා සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, වෛද්‍ය විද්‍යා පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ **ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පීඨයේ මුදල් අංශයේ** තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිම සිදුකල යුතුය.

8. අනුපිටපත මුල්පිටපතෙහි සහතික කරන ලද ජායාපිටපතක් විය යුතුය.

9. **2019/05/08 වන දින ප.ව.** 01.30 ට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයීය වෛද්‍ය විද්‍යා පීඨයේ මාණ්ඩලික රැස්වීම් ශාලාවේදි ලංසු විවෘත කරනු ලබන අතර ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයිනට මෙම අවස්ථාවට සහභාගි විය හැක**.**

10. අසම්පූර්ණ සහ ප්‍රමාද වී ලැබෙන ලංසුපත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර ලංසු භාරගැනිමේ හෝ ප්‍රතික්ෂේප කිරිමේ බලය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයීය දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව සතුවේ

**සභාපති**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන)**
**ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය**
**ගංගොඩවිල, නුගේගොඩ**